


# රුවන් නිදන හෙළ බිමයි



2021 නව වසරක් ලැබුවා. ලැබුවා වූ නව වසර 'සමවැදුම' පාඨකයින්ට වගේ ම සියළු ලෝ වැසියන්ට සුබ නව වසරක් වේවා! කියලා පතනවා.

සිංහල ගී රස විඳින අයත් එක්ක අපේ අදහස් බෙදාගන්නට ලියැවෙන 'සමවැදුම' වෙනුවෙන් නව වසරේ මුලින් ම දේශාභිමානී ගීයක් ගැන ලියන්නට හිතුවා. සිංහල ගී බිහිවෙන්නේ මව් බිමේ විතරක් ම නො වුණාට ඒ වෙනුවෙන් යොමුවෙන සියළු දෙනා ශ්‍රී ලාංකික සම්භවයක් ඇති උදවිය. ලොවේ කොයි ඉසව්වක සිටියත් තමන්ගේ දෙමව්පියන් ළඟට මුලින් ම සිහියට නැංවෙන්නේ අපේ හෙළ බිම, ශ්‍රී ලංකාව.

කවිය සදැස් සීමාවෙන් ඔබ්බට ගිහින් නිසදැස් ලියැවෙන්නට පටන් ගත්ත බව ඇත්ත. ඒත් නිසැදැස්, සදැස් කවි අභික්‍රමණය කළා කියලා නම් පිළිගන්න අමාරුයි. පද අගට විතරක් නෙවෙයි, පදයේ මැදත් එක ම අකුරකින් එළිසමය රකිමින්, චන්දසකට ලියැවෙන කවි 'සදැස්' කියලයි හැඳින්වෙන්නේ. 'චන්දස' කියන්නේ යම් රිද්මයානුකූල රටාවකට ගයන්නට පුළුවන් ලක්‍ෂණය. 'වෘත්ත' කියලා කියවෙන්නේත් මේ චන්දසඃ නැත්නම් සඳැස උපද්දවන රිද්ම රටාවමයි. සිංහල භාෂාවේ නම් ලඝු-ගුරු අකුර යෙදෙන සැටියි. ඒ අනුව පද බැඳෙන සැටිය පෙන්වන සැකිල්ල විදියට 'වෘත්ත' නම් කරන්න පුළුවන්. සංගීතයේ නම් මාත්‍රා කියන කාල මිණුම යෙදෙන සැකිල්ල. චන්දස, වගේ ම එළි සමය රකිමින් කවි ලිවීම වෙන ම ම හැකියාවක්. යම් කවියෙකුට වදන් ගැන ඇති දැණුම පරාසය වැඩි වන තරමටයි එකම අකුරින් අවසන් වන ගලපන්නට සිතට වචන ගලාගෙන එන්නේ.

කවියකත් ගී පද රචනාවකත් ඇති ප්‍රධාන ම වෙනස වෙන්නේ කවියකට වඩා ගී පද රචනාවක් ගායනීය ගුණයෙන් වැඩ වීම. ගීයක පදමාලාව සැඳැස් හරි. නිසඳැස් හරි කවි පෙළක් වෙන්න පුළුවන්. ඒ වගේ ම ඒ අන්ත දෙකේ සම්මිශ්‍රණයක් වෙන්නත් පුළුවන්. කො.වෙ. පඤ්ඤාපාල ප්‍රවීණ රචකයාණන් පබඳින්නට යෙදුණු 'රුවන් නිදන හෙළ බිමයි' ගීය වඩාත් සමීප වෙන්නේ චන්දසකට, වෘත්තකට අනුවන පදයක තුන් පොළක එළිසමය රකිමින් ලියැවුණ කවි පෙළකට.

පද රචනාවේ මුල කොටස සැළකුවහොත් 'රුවන්' වදනේ 'න්' අකුරත්, 'නිදන' වදනේ 'න' අකුරත් 'හෙළබිමයි' වදනේ 'යි' අකුරත් එළිසමය රකිනවා පද තුනකම. සිව් පද කවියක් ලෙසින් ලියැවුණත් මේ මුල් කොටසේ එළි සමය තුන් පළක රැකෙන්නේ පද තුනක විතරයි.

දෙවන කොටසේ කතාව වෙනස්. ඒ කොටසට තියෙන්නේ පද තුනක් විතරයි. පද තුනේ එළිසමය රැකෙනවා තුන් පළක. 'මගේ' වදනේ 'ගේ' අකුරත්, 'රුවන' වදනේ 'න' අකුරත්, 'හෙළබිමයී, වදනේ 'යි' අකුරත් එළිසමය තුන්පළක රකින අකුරු තුනයි.

පළවෙනි කොටසේ සැකිල්ලමයි තුන්වන වගේම පස්වෙනි කොටසේත් තියෙන්නේ. දෙවන කොටසේ සැකිල්ල නැත්නම් ආකෘතිය මයි හතරවන, හයවන කොටස්වලත් තියෙන්නේ.

මේ පද රචනාවෙන් අපට ඉස්මතු වෙන්නේ විශිෂ්ඨත ම කවියෙක්. ඒ කො. වෙ. පඤ්ඤාපාල කිවියරයායි.

මිණි නිදන් ගත හෙළබිමක් ගැන යි පද පෙළ ලියවෙන්නේ. ඇස් පාදවාලන හෙළ බිමක් මේ. දහම් නැණින් නිවන ලබා දෙන්නට හැකි වුණ බිමක් අපේ මව් බිම. මුළු ලොවට ම දහම් ආලෝකය ලබා දී හෙළි කළ බිමක් මේ.

ඒ නිසා මගේ රුවන් වෙන්නේත්, මගේ ඇස් දෙක වෙන්නේත්, මගේ නිර්වාණය වෙන්නේත් හෙළ බිමියි.

මිහිරෙන් පිරුණ හෙළ බිම, රුහිරය වගුරවා බිහි වුණ බිමක්.ලේ වගුරවමින් රටේ නිදහස වෙනුවෙන් යුගයෙන් යුගය සටන් වදින්නට වුණා අපේ විරුවන්ට. ඉසුරින් පිරුණ දිවයිනක් මේ අපේ හෙළ බිම. ඒ නිසා ම මගේ මිහිරිත ම දේශය වෙන්නේත්, මගේ පණ නල රකින රුහිරය වෙන්නේත්, මගේ ඉසුර වෙන්නේත් හෙළ බිම ම යි.

වීරවරයින් උපන් හෙළ බිමේ පඬිවරුන් බවට පත් වෙන්නත් අපේ ආදී මුතුන් මිත්තන්ට ඉඩ ලැබුණා. යුදයට වැදුණ සෙබළුන් රණ කාමයෙන් මත් කළ බිමක් මේ හෙළ බිම. ඒ නිසාම ලොවට බලපෑම් කළ, ලොව පාළනය කළ බිමක් අපගේ මව් බිම. ඒ නිසා ම මගේ තව්තිසා දෙව්ලොව වන්නේත්, හිස් මුදුනින් සළකන බිම වන්නේත්, මගේ නිවහන වෙන්නේත් හෙළ බිමයි.

දිවයිනේ මෙතෙක් බිහි වූ විශිෂ්ඨත ම සංගීතවේදී, ගායනවේදී, ගාන්ධර්වයාණන් වන ආචාර්ය වික්ටර් රත්නායකයන් මේ අගනා කවි පෙළ තමන් නතු කරගෙන ඇදහිය නො හැකි තරමේ ප්‍රශස්ත තනුවක් නිමවා ගත්තේ දේශාභිමානය ඉහළින් ම නැංවෙන අන්දමින්. පද රචනාවේ ඇති ගායනීය ගුණය, චන්දස, එළිසමයෙන් නැගෙන ධ්වනි පූර්ණ ගුණ සිය තනුවෙන් රත්නායකයන් ඉහළ නංවන්නේ ශබ්ද මාධූර්ය ගැන තමන් සතු පරිචය ඉහළින් ම ප්‍රකට කරවමින්.

අපේ මව් බිමේ භේරී වාද්‍ය භාණ්ඩයක් වන උඩැක්කියෙන් රිද්මය නංවමින් ඇරඹෙන ගී ගායනයේදී එක් වෙන්නේ දවුල. ඒ තවත් අපේ බෙර වාදන මෙවලමක්. බටනලාව, සිතාරය, වයලීන පෙළක් එකතු වෙලයි කෙටි සංගීත ඛණ්ඩ සරසාලන්නේ.

තමන්ටම අනන්‍ය වූ ප්‍රේමණීය මධුර හඬ දේශාභිමානයෙන් තේජස් වී කරවමින් ආචාර්ය වික්ටර් රත්නායකයන් ගායනා කරනා මේ ගීයේ ඇතැම් කොටස් සඳහා පිරිසකුත් ගායනයෙන් සම්මාදම් වෙනවා.

රුවන් නිදන හෙළබිමයි
නුවන් හදන හෙළබිමයි
නිවන් පුදන හෙළබිමයි
ලෙවා හෙළ කළ - හෙළබිමයි

මගේ රුවන හෙළබිමයි
මගේ නුවන හෙළබිමයි
මගේ නිවන හෙළබිමයි

මිහිරෙන් පිරි හෙළබිමයි
රුහිරෙන් පිරි හෙළබිමයි
ඉසුරින් සරි හෙළබිමයි
ලොව බලපෑ - හෙළබිමයි

මගේ මිහිර හෙළබිමයි
මගේ රුහිර හෙළබිමයි
මග් ඉසුර හෙළබිමයි

විරුවන් ලත් හෙළබිමයි
පඬිදුන් පත් හෙළබිමයි
යුදුවන් මත් හෙළබිමයි
ලොව හෙබැ වූ - හෙළබිමයි

මගේ තිදස හෙළබිමයි
මගේ සිරස හෙළබිමයි
මගේ නිවස හෙළබිමයි
හා..........................

*තනුව, සංගීතය සහ ගායනය -*
ආචාර්ය වික්ටර් රත්නායක
*රචනය:-* කො.වේ. පඤ්ඤාපාල.

PAHANA පහන
www.pahana.com.au



සිසිර දිසානායක